# සයමස් සපිරෙන විශ්වවාහිනීය

**සමන් කුලරත්න**

ඕස්ට්‍රේලියාවේ වාසය කරන ශ්‍රී ලාංකික අපිටම කියල රූපවාහිනී සේවයක්. ඔව්. විශ්වය සිසාරා මෙල්බර්න් පුරවරයේ සිට විකාශනය වන විශ්වවාහිනී ටීවී නාලිකාව විකාශන කටයුතු අරඹල ජුනි 17 වන දින වන විට මාස හයක් සම්පූර්ණ වෙනවා. මේ වන විටත් ඉතා ඉහල ගුණාත්මක වැඩ සටහන් සහ විශේෂාංග තුලින් මෙල්බර්න් ඇතුළු ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික ප්‍රජාවේ මෙන්ම ශ්‍රී ලංකාව ඇතුළු ශ්‍රී ලාංකිකයන් වෙසෙන අනෙකුත් රටවලත් ප්‍රේක්ෂක අවධානය ඇද බැඳ ගැනීමට මෙම නාලිකාව සමත් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම ලිළිසඳර, ,Saturday Breeze, මෙනුවර අපි, නොදුටු සෙවණැලි , වෛද්‍ය හමුව, ,Evening Chat ,, මෙල්බර්න් ශනිදා, ගී මංසල ,Chat with Ryle" ඉරුදින කතා බහ, ගීත්මාලා සහ දවසින් දවස වැනි










වැඩ සටහන් සහ විශේෂාංග මෙන්ම සජීවීව සහ පටිගත කිරීම් ඔස්සේ ප්‍රචාරයවන මෙල්බර්න් ශ්‍රී ලාංකීය ප්‍රජාවට වැදගත් වන සිදුවීම් සහ අවස්ථා අවරණය කෙරෙන වාර්තාමය වැඩ සටහන් ප්‍රේක්ෂක ප්‍රසාදය දිනා ගැනීමට හේතු පාදක වී තිබෙනවා. ශ්‍රී ලංකා රූපවාහිනී නාලිකාව සහ ඒකාබද්ධව ඉදිරිපත් කල මෙල්බර්න් සූර්ය මංගල්‍යය 2017 බෙරික් ශාක්‍යමුණි සම්බුද්ධ දහම් පාසලේ ළමා අවුරුදු උළෙල 2017 වික්ටෝරියානු භාෂා පාසලේ හැම්ප්ටර්න් පාර්ක් මධ්‍යස්ථානයේ සිංහල අංශයේ අවුරුදු උළෙල 2017 සහ මෙල්බර්න් වෙසක් සිරිය අළලා කල වාර්තාමය වැඩ සටහන් මේ අතරින් කිහිපයක්.

විශ්වවාහිනී නාලිකාවට සය මසක් පිරිම සම්බන්දයෙන් එහි සභාපතිත්වය දරන හිටපු කොන්සල් ජෙනරාල් බන්දු දිසානායක මහතා අදහස් දැක්වුයේ මෙසේයි.

"මේ වන තුරු මෙල්බර්න් සහ ඕස්ට්‍රේලියාවේ ජීවත් වන අපට අපේ දක්ෂතාවන්, හැකියාවන්, අත්දැකීම් වගේම දැනුම ලෝකය සමගින් බෙදා හදා ගැනීමට, විදහා පෑමට නිසි මගක් තිබුනේ නැහැ. ඕස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව තුල බොහෝ

විශ්වවාහිනී හි වැඩ සටහන් අධ්‍යක්ෂ නුවන් සමරපති මහතා සන්නස ට සිය අදහස් දක්වමින්

"නාලිකාව ආරම්භයේදී අප ඔබට පොරොන්දු වුයේ මුළු වැඩසටහන් ප්‍රමාණයෙන් 60% මෙල්බර්න් සහ ඔස්ට්‍රෙලියාවේ ඔබ වෙනුවෙන් වෙන් කරන බවටයි. නමුත් අදවන විට මුළු වැඩසටහන් ප්‍රමාණයෙන් 80% ම ඔස්ට්‍රෙලියාවේ ඔබ වෙනුවෙන් වෙන් කර ඇති බව පවසන්නේ ඉමහත් සතුටින්. මේ වන විට අප සතුව ඉතා දක්ෂ කාර්ය මඩුල්ලක් සිටින අතරම ඔවුන් ස්වේච්චාවෙන් කරනු ලබන සේවය අති මහත්. දැනට දිනකට පැය තුනකට සීමාවී ඇති අප විකාශනය නුදුරු දිනකදීම පැය විසි හතර දක්වා පුළුල් කිරීම අපේ ඉදිරි දැක්මයි. මෙය මෙල්බර්න් සහ ඕසට්‍රේලියාවේ ජීවත් වන ඔබට මහඟු අවස්ථාවක්. නිවේදනයට, වැඩ සටහන් සම්පාදනයට, සංස්කරණයට, කැමරාකරණයට සහ කාර්මිකරණයට ඔබ හැකියාවක් ඇත්තෙක් නම් විශ්වවාහිනී ඊට හොඳ තෝතැන්නක්."

දිගු ගමනක් යන්න නම් පළමු පියවර තැබිය යුතුයි කියලා කියමනක් අප අහල



ක්ෂේත්‍රයන්හි දස්කම් දක්වන ප්‍රවීණයන් මෙන්ම ආධුනිකයන්, ඒ කෙරෙහි උනන්දුව දක්වන්නන් බොහෝ සිටිනවා. ඔවුන් වෙනුවෙන් වේදිකාවක් තනාදීමයි අපේ අදහස වුනේ. එය අද සැබෑවක් බවට පත් වෙලා. ඉතා කෙටි කාලයක් තුල ගුණාත්මක භාවයෙන් පිරි සෑම ප්‍රේක්ෂක කොට්ඨාශයක්ම නියෝජනය වන අයුරෙන් හොඳ වැඩසටහන් රැසක් ඉදිරිපත් කිරීමට අපට හැකියාව ලැබී තිබීම අප ලද ජයග්‍රහණයක්. වැඩ සටහන් අධ්‍යක්ෂ තුමන් ප්‍රමුඛ උද්යෝගමත් අපේ කාර්ය මණ්ඩලය ඊට ප්‍රදානම සාධකයයි"

තිබෙනවානේ. ඉතින් විශ්වවාහිනී ය සුභ මුහුර්තියෙන් ඒ ගමන අරඹලා සයමස් සපිරෙන මේ මොහොතේ එකසිය විස්සට දෙසිය විස්සක් අවඩා ආයිබෝ වේවා, හරවත් ගුණවත් සහ නැණවත් වැඩ සටහන් සමගින් මෙල්බර්න් ඇතුළු ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික ප්‍රජාවට මෙන්ම විශ්වය සිසාරා වෙසෙන සියලු ශ්‍රී ලාංකිකයන්ට ප්‍රඥා ප්‍රදීපයක්ම වේවා යයි මෙල්බර්න් ඇතුළු ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික ප්‍රජාව වෙනුවෙන් සන්නස අප ප්‍රාර්ථනය කරනවා. සුබ ගමන් (